# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල


| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 65 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 14/01/2024<br>පැය1115 |

## මාධ්‍ය නිවේදනය

**දිවයින පුරා සිදුකරන ලද මාර්ග බාධක මෙහෙයුම සම්බන්ධව - පොලිස් මූලස්ථානය.**

පොලිස් නිලධාරීන් සහ පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් 1744 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 2024.01.12 වන දින දිවයින පුරා සියළුම පොලිස් වසම් ආවරණය වන පරිදි මාර්ග බාධක යොදා මෙහෙයුමක් සිදුකරන ලදී.

**මෙම මෙහෙයුම තුළින් යතුරු පැදි ඇතුළු රථවාහන 5796 ක් පරීක්ෂා කරන ලද අතර, පුද්ගලයන් 15215 දෙනෙකු පරීක්ෂාවට ලක් කර ඇත. මෙහිදී යතුරු පැදි 21 ක්, ත්‍රීරෝද රථ 12 ක් සහ වෙනත් රථවාහන 06 ක් පොලිස් භාරයට ගෙන ඇති අතර, සැකකරුවන් 96 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.**

බීමත්ව රිය ධාවනය කිරීම්, රියදුරු බලපත්‍ර නොමැතිව ධාවනය කිරීම්, තීරුබදු රහිතව දුම්වැටි ප්‍රවාහනය, මත්ද්‍රව්‍ය සහ මත්පැන් ප්‍රවාහනය, වාහන සොරකම්, තහනම් පිහි සන්තකයේ තබාගැනීම් සහ දැව ප්‍රවාහනය සම්බන්ධයෙන් සැකකරුවන් අත්අඩංගුවට ගෙන ඇති අතර, ඔවුන්ට එරෙහිව නීතිමය කටයුතු ක්‍රියාත්මක කර ඇත.

විෂ මත්ද්‍රව්‍ය බෙදාහැරීම, ජාවාරම් කිරීමේ ජාලය මැඩ පැවැත්වීම හා අපරාධ අවම කිරීම මෙම මෙහෙයුම් වල මූලික අරමුණයි.